# 7

උපසේන අවදි වූයේ උදෑ හිරු කිරණ කවුළුවෙන් ඇඳ මතට වැටෙද්දීය. වැස්ස නැවතී තිබිනි. කවුළුවෙන් පිටත ගස්වැල් වල රැඳුනු දිය බිඳු උදෑ හිරු එළියේ කොද්දේ ඇටි සේ දිලිසුනි.

කවුළු තිරය මෑත් කළ උපසේන පිටත බැලුවේය. තමා තවම නිරුවතින්. පිටත නාන කලයෙ දිය වෙනෙයි. මේ කාමරයේ තමා හැරෙන්නට වෙන කවුරුවත් නොමැත. පංචිමා කොහේ ගියාද? ඊයේ රාත්‍රියේ තමාට නිදා ගියේ ඇගෙන් පූර්ණ තෘප්තියකට පත්වූ පසුවය. ඈ කෙළි කටු වෙනකමෙන් ඔහුට අමුතුම සුවයක් ලැබුනා සේය. ඇගේ අත් ගතිය - ඇගේ කය ගතිය ...

දොර තවමත් වැසිලාය. උපසේන සිතුවේ ඔය පිටින් අගුල් ලා ඇත කියාය. නාන කාමරයට ගොස් සුළු දිය කැඩ ඇල්ල කළ උපසේන කලිසමත් කමිසයත් ඇඳ ගත්තේය.

ඔහු තිත්තමට දොර තල්ලු කළේය.

පුදුමයක්!

දොර ඇරුණි.

තමාට යා හැකිය.

ඔහු බෑගය ගන්නට සිතා ආපසු හැරුණේය. බෑගය කොතැනකවත් නොවීය.

'මේ මොන මගෝඩියක්ද? බෑග් එකට මුන් මොනවා කළාද දී ගාර? අර යකඩේ ඒක අරන් යන්න ඇති.. මගේ ගොඩමුව... ඕ ෂිට්!'

උපසේන කාමරයෙන් පිටව කොරිඩෝවට ආවේය. අවට පාළු විය.

ඔහු හිනි පෙළ බැස්සේය.

බල්ලෙක්වත් නෑ!

ඔහු ඉදිරි දොරටුව වෙතට ගියේය.

දොරටුවේ ඇතුළින් සිටි මුරකරුවා ඔහුට දොර හැරියේය. මේ තමා මෙයට පෙර නොදුටු මුරකරුවෙකි. කළු දිග තලය. රතු ඉර රවිය. ගෙල වට සුසරය හැඟිත රවිය. ඔහුගේ මුහුණේ කිසිම හැඟීමක් නොවීය.

'මේ මිනිහා රොබෝ යන්ත්‍රයෙක් වගේ' උපසේනට සිතුණි උපසේන පිටතට යත්ම පිටුපසින් දොර වැසුණි. 'මං ආයෙ ඔය මාලිගාව ඇතුළට යන්න ඕනැ කමක් නෑ. ඇඳුම් ටික නැතිවුණත් කමක් නෑ. මෙතනින් පිටවෙන්න ඕනැ' යි සිතමින් ඔහු තුලම බැස්සේය.

මෙය තුලක් නොවේ. විසල් උයනකි. රංජ රාත්‍රියේ අඳුරේ නොපෙනුණ සුන්දරත්වයක් මේ අවට තුමකතාම විය - ගොඩ ගස් සෙවණේ මල් පාත්තිවල නොයෙකුත් මල් පිපී තිබුණි. පෙරදු ද වට වැස්සෙන් තුම දියම රෝදී බවවත් විය. තුරු ලතා අතරේ කුරුලු කිචි බිචිය ඇසුණි. දැනටම මිනිසුන් දෙතුන් දෙනෙක් මල් පාත්ති අවට සුද්ධ පවිත්‍ර කරමින් සිටියහ. ඔවුන් හැඳ සිටියේ අමුඩ කොට පමණි. ඔවුන්ගේ අව් කැවුණු සිරුරු මස් පිඩු - බාහු සියල්ල අව්වෙන් දිලිසුණි. වැඩෙහි නිරත වූ ඔවුන් හිස ඔසවා බැලුවේ නැත.

ඒ අය පසු කරගෙන ඉදිරි ගේට්ටුව දැයි සිතෙන ඉසව්වට උපසේන පිය මැන්නේය. කුරුලු හඬ - පිපුණු මල් වලා කලෙන් බර නිල් අහස - සියල්ල පාරාදීසයක් මෙනි. රංජ රාත්‍රියේ පංචිමා මෙතැන සුන්දරත්වය ගැන කීවා සැබෑය. මෙවන් පරිසරයක් දමා යන්නේ කොහොමද?

පංචිමා ගැන සිතුවා පමණි - ඇගේ කටහඬ ඈතින් ඇසුණි. රංජ ළඟට ඈ සිනාසෙන හඬ. ඈ කතා කරන්නේ කා සමඟද? ඇගේ කටහඬ ඇදී ආවේ තමා යන්නට සිතූ ඉසව්වෙනි. උපසේන ඒදෙසට පය ඉක්මන් කරන විට ඇගේ කට හඬ නැවතිණි. මොහොතකට සියල්ල නිසසල විය. අනේ! කොතරම් සොඳුරු උද්‍යානයක්ද? එහෙත් - තමා මේ මායාවෙන් පලා යා යුතුය.

තවත් ඉදිරියට ගිය උපසේනට විශාල යකඩ ගේට්ටුව විවරව ඇති සැටි පෙනුණි.

'මට යන්න කිසිම බාධාවක් නෑනෙ!' ඔහුට තුටුම සිතුණි. 'මං මේ මිනිස්සුන්ව නිකරුණේ සැක කළා. කාලිංග තමාම කළේ උදව්වක්. වැස්ස වෙලාවෙ එක්කන් ආවා - බොස්ට කතා කළා - කන්න බොන්න දුන්නා - නිදාගන්න සුව පහසු කාමරයක් දුන්නා - හෙදියක් දුන්නා - වෙද හෙද කම් කළා - එසේ මෙහේ හෙදියක් කොමෙයි -

මුළු කාම සූත්‍රයම කට පාඩමෙන් දන්න කෙදියක්!

ගේට්ටුවේ මුදුනේ Σ අකුරත් Z අකුරත් අගේට පෙනුණු පුදුමය කියන්නේ කොයි පැත්තෙන් බැලුවත් කියැවෙන්නෙ ΣZ කියලා. ·සේරා- සහ ΣZ කාරයා- ගේට්ටුවෙන් පිටතට ගිය උපසේනට මදක් ඉදිරියෙන් සිට කීප දෙනා දෑස ගැසුණි.

අර ඉන්නේ - කාලිංග- පංචිමා - උගනෝ - තවත් තුන් දෙනෙක්. ඒ තුන් දෙනා වැඩ කරන අය වෙන්න ඕනෑ- අඹුඩ ඇඳ ගෙන. කාලිංග ඉර අව්වෙන් ඇස් මුවා කරගෙන උපසේන එන අත බැලුවේය. පංචිමා නිහඬය. ඔහුන්ගේ පසු පසින් කඩා වැටුණු යෝධ ගසකි. කොහෙවත් නරකට යා නොහැකි කැලෑවක් දකුණකට. එම පැත්තේ ගස් මුදුන කඩා වැටී දන්නේ කලපුවට.-

"මොනවද උපසේන? කොහොමවත් යන්න විදියක් නෑ." කාලිංග සුහදව කතා කළේය. ඔහු ඇඳ සිටින්නේ දම් රතු පැහැ ඩ්‍රෙසිං ගවුමකි. ඒ යට රතු-කොළ ඉරි දැමූ පිජාමා කලිසමකි. පංචිමා සුදු ගවුම ඇඳලාය. ඇය දැන් සිල් ගත්තාක් මෙන් නිහඬය. උපසේනව දන්නෙත් නැති ගානට- ඇගේ බොරුට බය ඇති...

" ඇයි කලපුවෙ බෝට්ටුවකින් මට යන්න බැරිද?"

තර්ක/ උපසේන තකී කරන්නාක් මෙන් ඇසුවේය.

"පුළු-වාන්" කාලිංග සිනා සුණේය. "යන්න බැරි කමක් නෑ- බෝට්ටුවක් තිබ්බ නම්."

"ඇයි බෝට්ටුවක් නැද්ද?"

"එක නෙමෙයි උපසේන දෙකක් තියෙනවා. එකක් රිපෙයාර් ෂොප් එකේ- අනික බඩු ගේන්න ගියා අද රෑ පාටියට."

"අද රෑ පාටිය?"

"ඔව් ඔව්. පොලිස් චීෆ් එනවා. දැනගත් බිස්නස් කාරයො දෙන්නෙක් එනවා. ඉඩම් හිමි ඩිවිලි කාරයෙක් එනවා. මගේ කසින් මල්ලි එනවා."

"කවුරු ආවත් කමක් නෑ. මට යන්න ඕනෑ."

"උපසේන ඔයා කලබල වෙනවා. මං මේ ගැන අනික් කරන්න විදියක් හිතනවා- ඔයා කලබල වෙනවා"

"බෝට්ටුව ආවාම මාව යවන්න."

"හරි- බෝට්ටුව ආවම ඔයාව යවන්නං" කාලිංග මදක් අමනාප ස්වරයක් පෑවේ අර කලින් තිබූ සැහැල්ලු පෙනුම වෙනස් කරමින්.

'මේ මිනිහා මාත් එක්ක තරහ වෙලාද මංදා? තරහ කරගත්තොත් - මට තමයි අමාරු වෙනවා - හිත හොඳින් තියාගන්න ඕනෑ - හිත රිදවන්න බෑ' උපසේනට සිතුණි.

'ඒ උනත් මේ මිනිහා මගෙ කාගෙ කවුරුද? නන්නාඳුනන අමුත්තෙක් - සල්ලිකාර පිස්සෙක් - හිතු මතේට ජීවත් වෙන මිනිහෙක්.'

"මිස්ට කාලිංග - මට යන්න ඕනෑ කොහොමත් නිසා නොවෙයි. මගෙ වයිෆ්ට සනීප නෑ. දූනා විතරයි ගෙදර -"

"ඒ උනාට ඔයා දවස් තුනක්ද කොහෙද කාකරගෙම ඉන්නව කියල නේද ආවෙ?"

"ඒක හරි-" මේ මිනිහට මතකයි.

"හොඳයි ඔයාට යන්නම ඕනෑ නං මං ඔයාව යවන්නං බෝට්ටුව එන්නෙ හවස් වෙලා. මගේ ගෙස්ට්ලත් එක්ක ගෙන. ඒ ආවම ටිකක් රෑ වෙයි. කමක් නෑ මං ඔයාව යවන්නං. ඔයා දැන් ටිකක් රෙස්ට් කරන්න. උදේට කෑවද? නැද්දෙ?"

"නෑ"

"යමු හොඳට රසට තේ එකක් බොමු - ඉස්වස්සෙ-"

"මගෙ ඇඳුම් බෑග් එක මට ඕනෑ"

"ආ ඒක - ඒක අරන් තිබ්බද හංචිමා?"

මෙතෙක් නිහඬව සිටි හංචිමා, "ඔව් සර්" කීවාය.

"ආ ඔව් උපසේන ඔයාගෙ බෑග් එක අපි සුරක්ෂිතව අරන් තිබ්බා -"

"ඒකෙ මගෙ අයි-සී එක - වටිනා කියන දේවල් සේරම -"

"ඕවා සේරම සුරක්ෂිතයි" ඒ කතා කළේ හංචිමාය.

කාලිංග උපසේනගේ කරට අත දමා ගත්තේ ගෙය අතට හැරෙමින්. කාලිංගගේ සිරුරෙන් පරවෙන ලයිලැක් මල් වල සුවඳක් ඇදී ආවේය. ලයිලැක් මල් - උපසේන ඒ සුවඳ දන්නේ ගෙදර තිබූ පුයර පෙට්ටියකිනි. එහි ලයිලැක් මල් සහිත චිත්‍රයක්ද විය. 'මේ ගෙදරත් ඒ වගේ පුයර පෙට්ටියක් හරි සෙන්ට් කුප්පියක් හරි ඇති' උපසේන සිතුවේය.

ගරඹිමාරු බලූ ඇට්ටික්කියක් සේ පස්සෙන්ම ආවාය. ඒ අනුව උගනෝ - ගස ළඟ සිටි මිනිසුන් තිදෙනා කසු කුසු ගාමින් ගස දෙසට හැරුණෝ මේ ගහ ඉවත් කරන්නේ කොහොමදැයි සැලසුම් කරන්නට විය යුතුය.

ප්‍රධාන දොර ළඟ සිටි සේවකයා නිහඬව දොර හැරියේය. කාලිංගත්, උපසේනත් ඇතුළු වූ පසු දොර වැසුණි. ගරඹිමා පෙනෙන අසලක නොවීය.

'ඒකි මක් ගාලා ජේජ් වෙලා ගියා' උපසේන සිතුවේය. 'ගෑනු විශ්වාස කරන්න බෑ - සුජා ඇරෙන්න.'

කාලිංගත් උපසේනත් අර කෑම මේසය සහිත ශාලාවට අවතීර්ණ වූහ.

විරේකා චතුරන් මුළුතැන් ගෙය අතට යන දොරටුව පුරා ගෙන මෙන් බලා සිටියාය. ඇගේ ශරීර ස්කන්ධය ඒ දොරට සරිලන පියනක් මෙනි.

"විරේකා අපිට උණු උණු තේ ගේන්න. ඉඳි ආප්ප - වාත් - සේරම ගේන්න."

විරේකා නිහඬව පිටව ගියාය.

මුල් අසුනේ හිඳගත් කාලිංග තම වම් පස අසුන උපසේනට පෑවේය.

"ඒ පාර තවත් කෑම වේලක්' උපසේනට සිතුණි. තමා සිතුවේ ඊයේ රාත්‍රී කෑමෙන් පසු පිටව යන්නටයි. දැන් තවත් දවසක් උදාලා. ප්‍රාතරාශයකුත් ඇවිදින්.

"මට ගෙදර කෝල් කරන්න ඕනා - බොස්ට කෝල් කරන්න ඕනා" උපසේන කීවේ හිඳ ගනිමින්.

"හරි - හරි උපසේන - කලබල වෙන්න එපා. වම්පස ද හරි? ජීවිතේ මාවතේ යනකොට දෙපස රෝස මල් ඉඹින්න - සුවඳ උරා ගන්න."

කාලිංගගේ කොළොම්මල් දර්ශනය - මෙතැන තියෙන්නේ රෝස මල් සුවඳක් නොව - පරවෙන ලයිලැක් මල් ගඳක් -

විරේකාත්, ඒ අනුව දෝසේ හා කිංකවිරෝ නම් සේවකයින් දෙදෙනාත් කෑම බඳුන් වඩවා ගෙන ආහ. විරේකා ගෙන ආවේ ඉඳි ආප්ප දීසියකි. කිංකවිරෝ ගෙන ආවේ අල හොද්දකි. දෝසේ අත පොල් සම්බෝලයකි. ඒවා කාලිංග ඉදිරියේ තැබූ සැනින් තිදෙනා වයින් කළ බෝනික්කන් තිදෙනෙකු සේ ආපසු හැරී

මුළුතැන් ගෙයකට ගියා.

"උපසේන - අපි තේ එක බීලා - ඔය කෝල් එක දීලා - "

"හ්ම්"

"ඊයෙ රෑ හොඳට නිදි ගත්තද?"

"ඔව්"

"කොහොමද පංචිමා? හොඳයිද?"

"පංචිමා? ඔව් - හොඳයි"

"හොඳයි - කවුද වෙදකම කළාද?"

"ඔව් ඔව් හොඳට කවුද වෙදකම කළා" වෙන වෙදකමකුත් කළා කියන්නට සිතුණත් උපසේන කට පියාගත්තේය. 'මේ මිනිහට අලුතෙන් කියන්න ඕනැයැ ඒ අතීතෙ නැති!'

"පංචිමා, පුතාම දක්ෂ ගෙදියක්. සම්බාහන කරලා හොඳට දන්නවා" කාලිංග කීවේය.

"මට ඒක තේරෙනා-" උපසේන "වෙන කමුදවන් නැති විදියට---" හැටි කියන්නට යත්ම විරේකාත්, කිච්චිරෝත්, ද්‍රෝසෝත් ඔවුන් එගෙන ආහ. පාන්, සීනි සම්බෝල, ආප්ප, පරිප්පු --- තිබුණ ආරෙන් විටා ගියා.

"කන්න කන්න" කාලිංග කීවේය.

පියාන අකමැත්තම වුව වීදුරු හඬුවෙන් උපසේන අත සෝදා ගත්තේය.

ඇත්තෙන්ම මේ කෑම ඉතා රසවත් විය. විරේකා සූප ශාස්ත්‍රයේ අග තැන් ගත්තිය කියා උපසේනට සිතුණි. තව මදකින් ඇය උණු තේ පෝච්චියක්, තේ කෝප්ප, කිරි, සීනි ඔඩුන් සහිත බන්දේසියක් ගෙනවුත් මේසය මත මදක් ඈතින් තැබුවාය. ඒ අනුව ආ කිච්චිරෝන්, ද්‍රෝසෝත් කාලිංග රාජ්‍යයේ වරදිම කාලිංග පිටුපසින් සිටගත්හ.

'මේ මිනිහා නම් රජෙක් වගෙයි' උපසේනට සිතුණි. 'බලන්නකෝ ජීවත්වෙන හැටි! අනම් රජම දැසි දස්සෝ - කෑමබීම - සුන්දර මාළිගාවක් - ලස්සන ගෙදියක් - තව මොනවද? - -'

විරේකා මදක් බලා සිට පිටව ගියාය.

උපසේන රස කෑමෙහි අතරමං විය. 'ගෙදරවත් කන්න නෑ මෙහෙම' ඔහු සිතුවේය. 'මේ මිනිහා ළඟ අපූරු කමක් තියෙනවා - ආගන්තුක ප්‍රතිෂ්ඨානං.'

උපසේන්ගේ සිතුවිලි කියවන්නාක් මෙන් කාලිංග කතා කළේය.

"උපසේන, මං අත්තටම කැමතියි ඔයා මේ කලාපයේ ඉතිහාසය - අපේ ගම්මුල ගැන ඉතිහාසය ලියනවා නං."

"බැරි කමක් නෑ -"

"ඉතිං ලියමු."

"පස්සෙ ලියමු - මං ආයෙ වෙලාවක එන්නං"

"මේ ඉන්න වෙලාවේ ටිකක් ලියමු - කොල පෑන් සේරම මං කාමරේට ගෙනත් දෙන්නං."

කම්මැලිකම යන්නත් එක්ක හොඳයි - උපසේනට සිතුණි. කොහොමටත් අද හවස යනවානං ඉන්න ඩිංගෙ ප්‍රයෝජන ගන්න ඕන - දවස නරක නෑ

"මට මේ පරිසරය බලන්න ඕන"

"ඔහොම කිසි තහනමක් නෑ" කාලිංග කීවේය. "ඕන තැනක ඇවිදලා බලන්න."

නිදු ලැබුණාක් සේ උපසේනට හැඟුණි - තමාට කතාව පිටත යන්නට අවසර තිබේ. මෙතැනින් යා හැකි මාර්ගයක් සොයා ගත යුතුමය. එතෙක් - තමා - අවනත විය යුතුය.

"කාලා ඉවර වෙලා ඇවිදින්න යන්න ආවාම මං කතාව තව ටිකක් කියන්නං"

"ඊට කලින් මං අර ෆෝන් කෝල්ස් දෙක ගන්න ඕන"

"හරි - හරි - කාලා ඉමුකෝ -"

උපසේන දින බිය නැතිව කෑම රස විඳියේය - ඉඳි ආප්ප - ආප්ප - පාන් - අල හොද්ද - පොල්සම්බෝල - සීනිසම්බෝල - පරිප්පු - බිත්තර ආප්ප --

ක්ලාවිරොත්, ද්‍රෝසෙත්, කාලිංගට හා උපසේනට අවශ්‍ය පරිදි කිරි තේ සාදා දුන්හ.

මේ තේ කෝප්පය හා, ඉතාම රසවත් විය.

දෙදෙනාම නිහඬව තේ බිව්හ.

"යමු" කී කාලිංග පුටුව තල්ලු කරමින් නැගිට්ටේ. ක්ලාවිරෝ ඒ පසු පසින් නැගිට පුටුව පසසට ඇද්දේය. ද්‍රෝසේ එය අනුකරණය කරමින් උපසේනගේ පුටුව පසු පසට කළේය.

උපසේන කාලිංග අනුව මුළුතැන් ගෙය අසල දිවෙන කොරිඩෝරයට අවතීර්ණ වූහේය.

ඔහු ප්‍රථමයට පත්වූයේ ඔවුනිස් වමනට වූ විශාල ශාලාව දකිමිනි. තමා මෙතෙක් නිදා සිටි කාමර ශාලාවට වඩා, මෙය හාත්පසින්ම වෙනස් විය.

මෙය දිලිසෙන සුමුදු ගල් ඇල්ලූ විශාල ශාලාවකි. එකෙළවර වූයේ විශාල වීදුරු ප්‍රාකාර කවුළුය. ඒවායෙන් පිටත නන් විධියකින් ඔබ්බේ කලප දිය දිස් විය. ඔමටම ලංවූ කවුළු වල රාමු කොට වූ වීදුරු පතෙල දෙකෙළවර විවරවූ විටම තිර රෙදි තද රත් පැහැ විල්ලූදය. සිවිලිමේ පවතා නැතක් තුරුකුරි. ඒ නම එකාකට මධ්‍යයේ පහතින් වල්ලුරෙන් දිගැති ආවරණ සහිත විදුලි පහන්ය. කාමර ශාලාව මෙන් කැ බිත්තිය විසා ගත්තේ සිවිලිමටම නැගෙන පොත් රාක්කය. එයට පහතින් වුරුන ලියෙන කැ විශාල ලියන මේසයකි. ඒ අසල ඇති මුහුණට මුහුණ ලා වූ ප්‍රවු දෙක සුව පහසු කැටයම් පැහැ සමින් වැසූ, අත් ඇල සහිත අසුන්ය.

ශාලාව මැදද සුව අසුන්ය. කොහොමද්දෝ! එන සිහිල් සුළං රළ මේ අවට නමා යයි. වායු සමීකරණය විය යුතුයි.

මේසය මත දුරකථනයකි.

කාලිංග පොත් රාක්ක වලට පිටුපා අසුනක හිඳ උපසේනට ඉදිරියෙන් හිඳ ගන්නට සන් කළේය.

"ගෙදර නොම්මරය කියන්න." කාලිංග කාරුණිකවර ස්වර සාර නඩකින් කීවේය.

උපසේන කටපාඩමින් නොම්මරය කීවේය. කාලිංග පරණ කාලේ ඩයල් දුරකථනයේ නොම්මර කරකවා සවනාව උපසේන අතට දුන්නේය.

එහා පස දුරකථනය නාද වෙනවා පමණි. කිසිදු පිළිතුරක් නැත. 'මේ ගෙදර මිනිස්සුන්ට මොනාව උනාද?' උපසේන දුරකථනය අල්ලාගෙනම සිටියේය.

"හරියට ඩයල් කළාද?" උපසේන ඇසුවේය.

"ඔව් ඔයාම ඩයල් කරන්නකෝ උපසේන" දුරකථනය විසන්ධි කර, ඔහු මුකාන කාලිංග උපසේන අතට නැවෙව්වේය.

උපසේන ඉතා පරිස්සමෙන් නොම්බර කැරකෙව්වේය. පෙර ප්‍රතිචාරයමැයි උපසේනට තවත් වාරයක් සිතුණි. මෙවර ඔහු තමාගේම පංගම දුරකථන නොම්බරය කැරකෙව්වේය. එය ක්‍රියා විරහිත විය. ඔහු බිඳුණු සිතින් සාප්පුව තොට්ටිල්ල මත සැතපුණේය..

මෙසය මත ලස්සන කොළ පාට වැස්මකින් යුතු විදුලි පහනකි. ඒ වැස්ම සිදුවා ඇත්තේ රන්පාට ගොලු කැදැත්තකි. අඩ කවාකාර කොළ පාට වැස්මෙන් නික්මෙන එළියට ඒ රන් ගොල්ලන් පසෙකින් මල්ලෙන විදුලි පහන සිහින් දුම්වලින් දිලිසෙයි. මේ සියල්ල කොතරම් මායාවක්දැයි උපසේනට සිතුණි. තම බිරිඳට හෝ පුතාට පණිවිඩයක් දී ගත නොහැකි දුරකථනයකින් ඇති වැඩක් තිබේද?

"ඉතිං මොකද කරන්නෙ උපසේන?" කාලිංගගේ ප්‍රශ්නය ඇසුණේය.

"මං දන්නෙ නෑ. මං යන්න ඕනෑ - එච්චරයි."

"ඔයාට යන්න ඕනෑ කතරගම නෙ?"

"ඔව් මගෙ අසයින්මන්ට් එක -"

"ඉතිං?"

"මං බොස්ට කතා කරන්න ඕනෑ"

"ආං කතා කරල බලන්න."

කාලිංග දුරකථනය දුන්නේ කිසිම පසුබෑමකින් තොරවය.

උපසේන තම ප්‍රධාන කාර්යාලයට කතා කරන්නට නොම්බර කැරකෙව්වේය.

මුල්වතාවේ නාද වූවා පමණි. දෙවැනි වතාවේ පණිවිඩයක් තියන්නයි කියනු ඇසිණි. උපසේන නැවතිල්ලේ කතා කළේය

"සර් - මේ උපසේන - මී - මම තාම ඉන්නෙ කාර්සර - මට සර් එනකල් බලා හිටියා. මී - ඔයගේ ෆෝන් එක මිසිං... සර් මේ නම්බර් එකට කතා කරන්න - නම්බර් එක? නම්බර් එක?" කී උපසේන පිළිතුර සොයන්නට මෙන් කාලිංග දෙස බැලුවේය.

කාලිංග එක දිගට - බිංදුවයි එකයි එකයි හතයි හයයි ආදී වශයෙන් කියාගෙන ගියේය

උපසේන ඒ ඇසූ ඇසූ දෙය ගිරවෙකු මෙන් කියා

සාවධානව නැඹුරුවේය.

"දැන් හරිද?" කාලිංග ඇසුවේ දිව ඇදලාය. ඒ දසේ දැන්නේ දිනලටම කාන්දිත වකාව බැල්මකි. ජීවිය සිහින් කරවි සිනහවකි. තමා සමාධිවලයට පත්වූවාක් මෙනි.

"මං දන්නෙ නෑ - කාලිංග -"

"නාම ඔයාගෙ මිස්ට අනුකෝ-රාල නිදි ඇති. අපි තව දවල් වෙලා ආයෙත් කතා කරමු. ඔයා රෙස්ට් කරන්න. මගේ ලියන්න තියෙන දේවල් ගැන කතා කරමු - පස්සෙ."

"මට මගෙ බෑග් එක ඕනෑ"

"ඒක අරන් තියල තියෙන්නෙ මං ඒක දෙන්නං - කාමරේට යමු. ගිහින් ශරීර කිස නිමා කරලා නාගන්න. ඒක හොඳයි නේද?"

කාලිංග කියද්දී උපසේන හිස් බැල්මෙන් බලා සිටියේය. දැඩි පිපාසාවක්...

"මට - තිබහයි" උපසේන තොල සාට ලෙව කා කීවේය.

කාලිංග මේසය කෙළවර බොත්තමක් එබුවේය.

කන්නාමිරෝ ශාලාවට ආවේය.

"මේ සර්ට වතුර එකක් ගෙනත් දෙන්න - හොඳට කැල් - ආ"

කන්නාමිරෝ නිහඬව පිටව ගියේය.

අසුනෙන් නැගී උපසේන විසල් ජනේල කවුළුව වෙතට ගොස් පිටත බැලුවේය.

වත්ත යාට ඈතට තවත් දෙමහල් ගොඩනැගිල්ලක් දිස්වෙයි. එය නිම්වා නැති ගොඩනැගිල්ලකි. එතැන හතර දෙනෙක් වැඩ කරනු පෙනෙයි.

එකෙක් සිමෙන්ති අනයි. තවකෙක් සිමෙන්ති බදුම ඔසවා යයි. තවකෙක් බිත්තියක් කපරාරු කරයි. තවකෙක් කවුළුවක් මනියි. ඔවුන් කතා බහ කරනු පෙනෙන්නේ නැත. වැඩේ නිරත වූ ඔවුන්ට අවට ලෝකය ගැන වගක් නැතුවාක් මෙනි.

කන්නාමිරෝ සිනිල් පැන් වීදුරුවක් ගෙන උපසේන අසලට විත් සිට ගත්තේය. උපසේන ඒ පැන් සියල්ල එක හුස්මට බී බන්දේසිය අල්ලා සිටි කන්නාමිරෝ දෙස බැලුවේය.

සේවකයාගේ දසේ වූයේ හිස් බැල්මකි.